(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 5(2).]

# පාර්ලිමේන්තුවේ අංක 5 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2016 දෙසැම්බර් මස 21 වැනි බදාදා**

---

## 2017 පෙබරවාරි මස 07 වැනි අඟහරුවාදා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

634/'16

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) මූලික සුදුසුකම් සපුරා නොමැති පුද්ගලයන්, විධිමත් බඳවා ගැනීමේ පටිපාටියකින් තොරව වන්නි දිස්ත්‍රික්කයේ සමෘද්ධි නිලධාරීන් ලෙස බඳවාගෙන ඇති බව දන්නේද;

(ii) එලෙස සුදුසුකම් නොමැතිව බඳවාගෙන ඇති සමෘද්ධි නිලධාරීන්ගේ තොරතුරු කවරේද;

(iii) අවිධිමත් ලෙස පත්කර ඇති පුද්ගලයන් සේවයෙන් ඉවත් කර විධිමත් ලෙස අලුතින් නිලධාරීන් බඳවා ගැනීමට කඩිනම් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

864/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) සීමාසහිත ලංකා පොහොර සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙකු ලෙස චන්දන පැල්පිට මහතා සේවය කරන්නේද;

(ii) එසේ නම්, ඔහුගේ වැටුප, දීමනා සහ ලබාදී ඇති වාහන සඳහා මාසික කුලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් 2015 නොවැම්බර් 06 දාතමින් පෙත්සම් අංක PCI/52/2015 යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපියක් එවා තිබේද;

(iv) එම ලිපියේ සඳහන් ආකාරයට චන්දන පැල්පිට මහතා ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස සේවය කළ අවධියේ සිදුකර ඇති බරපතල මූල්‍ය වංචා කවරේද;

(v) එම මූල්‍ය වංචාවන් සඳහා ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශ කවරේද;

(vi) එම නිර්දේශ ක්‍රියාත්මක කළ දිනය කවරේද;

(vii) ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශයන් ක්‍රියාත්මක නොකළේ නම්, ඒ සඳහා හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

899/'16

ගරු විමල් රාජපක්ෂ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, වීරවිල සහ යෝධකණ්ඩිය ගොවිජන සේවා මධ්‍යස්ථාන බලප්‍රදේශ මඟින් පොහොර සහනාධාරය සඳහා ඉල්ලුම්කර ඇති ගොවීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගොවීන් අතරින් පොහොර සහනාධාර මුදල් ලබාදුන් ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(iii) පොහොර සහනාධාර මුදල් ලබාදීමට නියමිත ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(iv) පොහොර සහනාධාර මුදල් නොලැබුනු ගොවීන් සඳහා මුදල් ලබාදීමට නියමිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1039/'16

ගරු කනක හේරත් මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේදී ජීවනාධාර දීමනා ලබා දී ඇති ආබාධ සහිත පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2015 වර්ෂයේදී ආබාධ සහිත පුද්ගලයන් සඳහා ජීවනාධාර ලෙස ලබා දී ඇති මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2016 සැප්තැම්බර් 30 වනවිට අලුතින් ඉල්ලුම් කළ ආබාධ සහිත පුද්ගලයන් සඳහා දීමනා ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2015 වර්ෂයේ සිට මෙම දීමනා නොලැබෙන ආබාධ සහිත පුද්ගලයන් සිටින බව පිළිගන්නේද;

(ii) එසේ නම්, කෑගල්ල දිස්ත්‍රික්කයේ සිටින එවැනි ආබාධ සහිත පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (ii)හි සඳහන් පුද්ගලයන් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පුද්ගලයන්ට මෙම වර්ෂය තුළදී දීමනා ලබාදීම වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1063/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2015.01.08 දිනට සමෘද්ධිලාභීන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයේදී දීප ව්‍යාප්තව සිදුකරන ලද සමෘද්ධි සමීක්ෂණ වාර්තාවට අනුව සමස්ත සමෘද්ධිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත වාර්තාවට අනුව එක් එක් දිස්ත්‍රික්කයේ සමෘද්ධිලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත වාර්තාව අනුව සමෘද්ධි ආධාර ලබාදීම කපා හැරෙන පවුල් සිටින්නේද;

(iv) එසේ නම්, සමෘද්ධි ආධාර ලබාදීම කපා හැරෙන පවුල් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1100/'16

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කවල සිටින තැල්සීමියා රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝගීන් පදිංචිව සිටින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iii) තැලිසීමියා රෝගයට ගොදුරු වූවන්ට ප්‍රතිකාර කිරීම සඳහා ශල්‍යාගාරයක් හා ජාන බැංකුවක් වයඹ පළාත තුළ පිහිටා තිබේද;

(iv) එම රෝගීන්ට ප්‍රතිකාර හා අනෙකුත් පහසුකම් ලබාදීමට අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1218/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පළාත් පාලන ආයතන විසුරුවා හැර මැතිවරණ නොපවත්වා ගතව ඇති කාලය වසර 1½ ඉක්මවා ඇති බව එතුමා පිළිගන්නේද;

(ii) නව පළාත් පාලන මැතිවරණ පනත ප්‍රකාරව, පසුගිය රජය විසින් සීමා නිර්ණය කොමිසම පත් කරනු ලැබූ දිනය; කොමිසමේ කාලය අවසන් වූ දිනය සහ එම කොමිසමේ නිර්දේශ සළකා බැලීමෙන් අනතුරුව නව සීමා නිර්ණය සහිත කොට්ඨාස ගැසට් කරනු ලැබූ දිනය; වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වත්මන් රජය විසින් සීමා නිර්ණය කොමිසම පත්කරනු ලැබූ දිනය කවරේද;

(ii) ඔවුන් වෙත ලැබී තිබූ සංශෝධන සංඛ්‍යාව කොපමණද;

(iii) අදාළ සංශෝධන ඉදිරිපත් කළ දිනයන්, පුද්ගලයන් හා ආයතන කවරේද;

(iv) නිවැරදිව නිර්ණය කළ බවට පිළිගත් සංශෝධන නොමැති පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් පළාත් පාලන ආයතනවල නම් කවරේද;

(vi) එම පළාත් පාලන බලප්‍රදේශ සඳහා මැතිවරණ පැවැත්වීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2017 පෙබරවාරි මස 08 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

384/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය ට්‍රාන්ස්ෆෝමර් ලබා ගැනීමේදී ටෙන්ඩර් කැඳවීමක් කරන්නේද;

(ii) එසේ නම්, පසුගිය වසර පහ තුළ ටෙන්ඩර් කැඳවීමේදී ඉදිරිපත් වූ ආයතන එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ආයතනවලින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වටිනාකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ආයතන අතරින් තෝරාගත් ආයතන එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දැනට ලංකා විදුලිබල මණ්ඩලයට ට්‍රාන්ස්ෆෝමර් සපයන ආයතනය කුමක්ද;

(ii) එම ආයතනයේ හිමිකරු/ හිමිකරුවන් හා/හෝ අධ්‍යක්ෂ මණ්ඩල කවුරුන්ද;

(iii) ඔවුන් ලංකා විදුලිබල මණ්ඩලය තුළ දරන තනතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ට්‍රාන්ස්ෆෝමර් ලබා ගැනීම සඳහා නැවත ටෙන්ඩර් කැඳවන දිනය කවරේද;

(ii) එහිදී අනෙකුත් ටෙන්ඩර්කරුවන්ට සිදුවිය හැකි අපහසුතා අවම කිරීමට ගන්නා පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

918/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැන්විල් හෝල්ඩින්ස් පෞද්ගලික සමාගම (Canwill Holdings (Pvt.) Ltd.) ආරම්භ කළ දිනය කවරේද;

(ii) එහි කොටස් හිමියන් කවුරුන්ද;

(iii) එම කොටස් හිමියන් විසින් සමාගම ආරම්භයේදී ආයෝජනය කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම සමාගමේ ආරම්භක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් කවුරුන්ද;

(v) ආරම්භක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ(i) හි සඳහන් සමාගමට අනුබද්ධ සමාගම් ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, එම අනුබද්ධිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් කවුරුන්ද;

(iii) ඔවුන්ගේ වැටුප් හා දීමනා කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

943/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බ්ලූමැන්ඩල් සහ මීතොටමුල්ල යන ස්ථානයන්හි එකතු වී ඇති කසළ දුම්රිය මාර්ගයෙන් ප්‍රවාහනය කර වනාතවිල්ලුව, අරුවක්කලු ප්‍රදේශයේ අක්කර 80ක බිම් ප්‍රදේශයක සනීපාරක්ෂක පිරවුම් සිදු කිරීමට සැලසුම් කළ බවත්;

(ii) එම ව්‍යාපෘතියෙන් කොලොන්නාවේ, මීතොටමුල්ල කසළ හුවමාරු මධ්‍යස්ථානයක් ඉදි කිරීමට, දුම්රිය මාර්ග වැඩි දියුණු කිරීමට සහ උපකරණ මිල දී ගැනීමටත් සැලසුම් කළ බවත්;

(iii) 2015 වර්ෂය සඳහා වූ අයවැයෙන් මෙම ව්‍යාපෘතිය සඳහා, රුපියල් මිලියන 14,000ක් වෙන් කර තිබුණු බවත්;

(iv) 2014 වර්ෂය අගදී ව්‍යාපෘතියේ පළමු අදියර 02හි ප්‍රසම්පාදනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුනු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතියේ වත්මන් ප්‍රගතිය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය නතර කර තිබේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

958/'16

ගරු බිමල් රත්නායක මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රුහුණු විශ්වවිද්‍යාලයේ දැනට ක්‍රියාත්මක පීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) එහි ක්‍රියාත්මක දෙපාර්තමේන්තු සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් පීඨවල හා දෙපාර්තමේන්තුවල සිටිය යුතු ස්ථිර ආචාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ස්ථිර ආචාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තිබේද;

(v) එසේ නම්, පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් පීඨය සහ දෙපාර්තමේන්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1040/'16

ගරු කනක හේරත් මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ජල නල දීර්ඝ කිරීම් සහ නව සම්බන්ධතා ලබා ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ලැබී ඇති ඉල්ලීම් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට ලබා දී ඇති ජල නල දීර්ඝ කිරීම් සහ නව සම්බන්ධතා සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (ii) හි සඳහන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(iv) රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වල්ගම හන්දියේ සිට දොඹේමඩ මාර්ගයේ ජල දිගුව, කටුපිටිය මාර්ගයේ ජල දිගුව, නාරම්බැද්ද මාර්ගයේ ජල දිගුව, පරපේ මාර්ගයේ ජල දිගුව සහ මුවපිටිය හලාගිරිය මාර්ගයේ ජල දිගුව දීර්ඝ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ඉල්ලීම් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1041/'16

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සපුමල්තැන්න, වැලිඔය ප්‍රදේශයේ නැවත පදිංචි කරන ලද රජයේ නිලධාරින් සඳහා නිවාස ණය ලබා දුන්නේද;

(ii) එසේ නම්, එම නිලධාරින් අතරින් හමුදා සේවයේ නියුතු 13 දෙනෙකුට නිවාස ණය ලබාදීමට කටයුතු නොකළේ මන්ද;

(iii) එම 13 දෙනා සඳහාද නිවාස ණය ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1107/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අංක SLFR891/2009 නඩු තීන්දුව මඟින් 2009.10.20 දින සිට, එනම් පැවති හෝමියෝපති වෛද්‍ය සභාව ඉවත් කළ දින සිට අමාත්‍යවරයා විසින් නව වෛද්‍ය සභාවක් පත්කිරීමද, එම වෛද්‍ය සභාව මඟින් වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සහ ලබා දුන් පත්වීම් හා සියළු ක්‍රියාකාරකම් බල රහිත ලෙස සැළකිය යුතු බව ප්‍රකාශ කරනු ලැබුවේද;

(ii) ඉහත කී නඩු තීන්දු දිනය වූ 2016.03.31 දින සිට පෙත්සම්කරුවන් නියෝජනය කරන එකී වෛද්‍ය සභාවට වසර 1½ක කාලයක් නීත්‍යානුකූල වෛද්‍ය සභාව ලෙස කටයුතු කිරීමට අයිතියක් ඇති බවද පැහැදිලි කරනු ලැබුවේද;

(iii) ඒ අනුව, අමාත්‍යවරයා විසින් ඉහත කී කාරණයට අදාළ කාලපරිච්ඡේදය තුළ සිදු කරන ලද නීති විරෝධී පත්වීම් සහ අනිකුත් ක්‍රියාකාරකම් ආපස්සට බලපාන ලෙස ඉවත් කිරීමට කටයුතු කරන්නේද;

(iv) නව නීතියට අනුව අතුරු වෛද්‍ය සභාව සඳහා පත්වීම් සිදු කිරීමේදී අමාත්‍යවරයාට පත් කළ හැකි තනතුරු සඳහා මෙම නඩුවේ පෙත්සම්කරුවන් පත් කර ප්‍රශ්න නිරාකරණය කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1109/'16

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගොවි සතිය නිමිත්තෙන් 2016 ඔක්තෝබර් 08 වැනි දින "ගොවි දිනය" නමින් උත්සවයක් පැවැත්වුයේද;

(ii) එසේ නම්, එම උත්සවය පැවැත්වූ ස්ථානය කවරේද;

(iii) එම උත්සවය පැවැත්වීමේ අරමුණ කවරේද;

(iv) එමඟින් රටේ ගොවි ජනතාවට ලැබුනු ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ගොවි දින උත්සවය වෙනුවෙන් කිරි අම්මාවරුන් වෙනුවෙන් දානයක් පැවැත්වූයේද;

(ii) ඒ සඳහා සහභාගි වූ කිරි අම්මාවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ගොවි සතිය හා කිරි අම්මාවරුන්ගේ දානය වෙනුවෙන් රාජ්‍ය අරමුදල් වැය කරනු ලැබුවේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කළ මුළු රාජ්‍ය අරමුදල් ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 පෙබරවාරි මස 09 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

387/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2015 වර්ෂයේදී යුධ හමුදාවට ශාරීරික අභ්‍යාස සඳහා අවශ්‍ය කැන්වස් සපත්තු මිලදී ගැනීමට ටෙන්ඩර් කැඳවූ අවස්ථාවේ ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ ආයතන කවරේද;

(ii) එම ආයතන ඉදිරිපත් කළ ටෙන්ඩර් වටිනාකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ටෙන්ඩරය ලබාගත් ආයතනය කවරේද;

(iv) එම ආයතනයට ටෙන්ඩරය ලබාදීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයේදී මෙම සපත්තු මිලදී ගැනීමට අදාළ ආරක්ෂක අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සිටි නිලධාරීන්ගේ නම් හා තනතුරු කවරේද;

(ii) මෙම නිලධාරීන් ටෙන්ඩර් මණ්ඩලයේ කොපමණ කාලයක සිට කටයුතු කරන්නේද;

(iii) 2015 වර්ෂයේදී මෙම සපත්තු මිලදී ගැනීමට අදාළ යුධ හමුදා ටෙන්ඩර් මණ්ඩලයේ සිටි නිලධාරීන්ගේ නම් හා තනතුරු කවරේද;

(iv) මෙම නිලධාරීන් ටෙන්ඩර් මණ්ඩලයේ කොපමණ කාලයක සිට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ආරක්ෂක අමාත්‍යාංශය හා යුධ හමුදා ටෙන්ඩර් මණ්ඩලවල අඛණ්ඩව සේවය කරන නිලධාරීන් ඉවත් කිරීමට රජය කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර දිනයකදීද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

919/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොල්ලුපිටිය, හයට් හෝටල් (Hyatt Hotel) සංකීර්ණය ඉදිකරන ඉඩමේ වර්ග ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම ලබාගෙන ඇත්තේ බදු පදනමින්ද;

(iii) එසේ නම්, ඒ කවර ආයතනයෙන් කවර කාලයකටද;

(iv) එම ඉඩමේ තක්සේරු වටිනාකම කවරේද;

(v) එම ඉඩමේ බදු වටිනාකම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හෝටලය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවා තිබේද;

(ii) එසේ නම් එම දිනය කවරේද;

(iii) ඉදිරිපත් වූ කොන්ත්‍රාත්කරුවන් හා ඔවුන් ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අත්සන් කළ දිනය කවරේද;

(v) ඒ සඳහා උත්සවයක් පවත්වනු ලැබුවේද; එසේ නම්, එහි වියදම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉදිකිරීම් සඳහා විදේශීය ඉංජිනේරු උපදේශක සේවා ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, එම ආයතනය කවරේද;

(iii) ඒ සඳහා ගෙවූ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

959/'16

ගරු බිමල් රත්නායක මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය විශ්වවිද්‍යාලයේ දැනට ක්‍රියාත්මක පීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) එහි ක්‍රියාත්මක දෙපාර්තමේන්තු සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් පීඨවල හා දෙපාර්තමේන්තුවල සිටිය යුතු ස්ථිර ආචාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ස්ථිර ආචාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තිබේද;

(v) එසේ නම්, පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් පීඨය සහ දෙපාර්තමේන්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

998/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 1972 සිට 2009 දක්වා කාලය තුළ දෙමළ බෙදුම්වාදී ත්‍රස්තවාදය හේතුකොට ගෙන මියගිය සහ තුවාල ලැබූ ශ්‍රී ලංකා පොලීසියේ සාමාජිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1108/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ 07, මේට්ලන්ඩ් පෙදෙසේ, අංක 55/2/T/85 දරන ස්ථානයෙහි පදිංචි ඒ. සමීර පුෂ්පකුමාර යන අයගේ දරුවා සහෝදර පදනමින් කොළඹ රාජකීය විද්‍යාලේ, 1 වැනි ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා ඉල්ලුම් කිරීමෙන් පසු, සම්මුඛ පරීක්ෂණයට කැඳවා ලකුණු 62ක් ලබාදුන් බවත්;

(ii) සහෝදර පදනමින් ඇතුළත් කරගැනීම සඳහා අවශ්‍ය ලකුණු ප්‍රමාණය 44 ක් වුවත්, ඉහත කී අයගේ දරුවා ලකුණු 62ක් ලබා තිබියදීත් පාසලට ඇතුළත් කර නොගත් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) මෙම දරුවාට සිදුවී ඇති අසාධාරණය පිළිබඳව සළකා බලා ඔහු රාජකීය විද්‍යාලයේ 1 වැනි ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1111/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය නිසා බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාව විශාල ලෙස පීඩාවකට ලක්වී ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, පීඩාවට ලක් වී ඇති පවුල් සංඛ්‍යාව හා ඔවුන් අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම සංවර්ධන ව්‍යාපෘතිය සිදුකිරීමට පෙර පරිසර ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් ලබාගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් ලබාදී ඇති තීන්දුවට අනුව අදාළ පුද්ගලයන්ට සහන ලබාදීමට අමාත්‍යාංශය කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, ඒ මන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1140/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවන ලද දිනය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ පිටපතක් සභාගත කරන්නේද;

(iii) එරාවූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් ආවරණය වන සම්පූර්ණ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එහි ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(v) එම ග්‍රාම නිලධාරි වසම්වල නිල අංකයන් හා නාමයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එරාවූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවීමේදී නිල වශයෙන් සීමා නිර්ණය කිරීමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එරාවූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ග්‍රාම නිලධාරි වසම් අතරින් කිසියම් වසමක/වසම්වල පරිපාලන කටයුතු හෝ මෙහෙයවීම් වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදු කරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ග්‍රාම නිලධාරි වසම්වල නම්, නිල අංකයන් ඇතුළු විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1151/'16

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ ප්‍රදේශයෙන් බැහැර කරනු ලබන කැළිකසළ ජා ඇල ප්‍රදේශයට ගෙන ගොස් දැමීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එවැනි පියවර නිසා ප්‍රදේශයේ ජල මූලාශ්‍රවලට සහ ජන ජීවිතයට විශාල හානියක් සිදුවන බව පිළිගන්නේද;

(iii) ජා ඇල ප්‍රදේශයේ ජනතාවට අධික පීඩනයක් ගෙන දෙන මෙම ව්‍යාපෘතිය නවතා දැමීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1168/'16

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාවලපිටිය මැතිවරණ බලප්‍රදේශයට අයත් උලපනේ පිහිටි කර්මාන්තපුරය ආරම්භ කිරීම සඳහා පසුගිය රජය විසින් වෙන්කළ මුදල කොපමණද;

(ii) එහි කර්මාන්ත ශාලා කොපමණ ප්‍රමාණයක් ආරම්භ කර ක්‍රියාත්මක වූයේද;

(iii) මේ වනවිට වැසී ගොස් ඇති කර්මාන්තශාලා ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (අ) හි සඳහන් කර්මාන්තපුරය යළි නගා සිටුවීමට නව වැඩපිළිවෙළක් සකස් කර තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1264/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍ය කාර්ය මණ්ඩලයට පත් කර ඇති,

(i) සම්බන්ධීකරණ ලේකම්වරයන්;

(ii) උපදේශකවරයන්;

(iii) අනෙකුත් කාර්ය මණ්ඩල;

සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සමස්ත කාර්ය මණ්ඩලය කොපමණද;

(ii) සමස්ත කාර්ය මණ්ඩලය සඳහා මාසිකව වෙන් කර ඇති දීමනා, වැටුප්, වාහන, ඉන්ධන හා අනෙකුත් සියලුම වරප්‍රසාද ඇතුළත් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

539/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 වනවිට ශ්‍රී ලංකාවේ කුරුඳු වගා කරනු ලැබූ භූමි ප්‍රමාණය කොපමණද;

(ii) 2010 සිට 2015 දක්වා වසර පහ තුළ කුරුඳු නිෂ්පාදනය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කිලෝග්‍රෑම් කොපමණද;

(iii) රජය විසින් ගොවීන්ගෙන් සෘජුවම කුරුඳු මිලදී ගන්නේද;

(iv) එසේ නම්, පසුගිය වසර පහ තුළ රජය විසින් මිලදී ගත් කුරුඳු ප්‍රමාණය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුරුඳු නිෂ්පාදනය ඉහළ නැංවීමට රජය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

960/'16

ගරු බිමල් රත්නායක මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සබරගමුව විශ්වවිද්‍යාලයේ දැනට ක්‍රියාත්මක පීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) එහි ක්‍රියාත්මක දෙපාර්තමේන්තු සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් පීඨවල හා දෙපාර්තමේන්තුවල සිටිය යුතු ස්ථිර ආචාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ස්ථිර ආචාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තිබේද;

(v) එසේ නම්, පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් පීඨය සහ දෙපාර්තමේන්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1000/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009 මැයි 19 දිනට උතුරු පළාතේ පැවැති යුද, නාවික සහ ගුවන් හමුදා කඳවුරු සංඛ්‍යාව සහ ඒවායේ භූමි ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015 ජනවාරි 08 දිනට උතුරු පළාතේ පැවැති යුද, නාවික සහ ගුවන් හමුදා කඳවුරු සංඛ්‍යාව සහ ඒවායේ භූමි ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2016 සැප්තැම්බර් 30 දිනට උතුරු පළාතේ පැවැති යුද, නාවික සහ ගුවන් හමුදා කඳවුරු සංඛ්‍යාව සහ ඒවායේ භූමි ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1131/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) (වෛද්‍ය) නෙවිල් ප්‍රනාන්දු ආයෝජන පෞද්ගලික සමාගම ශ්‍රී ලංකාව තුළදී වෛද්‍ය උපාධිය පිරිනැමීම සඳහා අවසරය ඉල්ලා තිබේද;

(ii) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඒ සඳහා අවසරය ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

(iv) අවසර ලබා දීමේ ලිපිය සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රුසියාවේ, නිෂ්නි නොව්ගොරොද් රාජ්‍ය වෛද්‍ය විද්‍යාලය (Nizhny Novgorod State University) සමඟ ඒකාබද්ධව උපාධි පිරිනැමීමේ ආයතනයක් ශ්‍රී ලංකාව තුළ පිහිටුවීමට එම සමාගම අවසරය ඉල්ලා තිබේද;

(ii) ඒ සඳහා අවසර ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

(iv) අවසර ලබා දීමේ ලිපිය සභාගත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) South Asian Institute of Technology and Management නමැති සමාගම South Asian Institute of Technology and Medicine ලෙස සිය ආයතනයේ නම වෙනස් කළ බව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට දැනුම් දී තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

582/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2008.01.09 දින සිට 2008.04.09 දින දක්වා පැවති ආහාර හා ඖෂධ පරීක්ෂකවරු බඳවා ගැනීමේ ත්‍රෛමාසික පුහුණු පාඨමාලාවට සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපින, පළාත හා සේවා ස්ථාන කවරේද;

(iii) මෙම පාඨමාලාව අවසානයේ ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වූ දින වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ප්‍රායෝගික පරීක්ෂණය සමත් වීමේ කඩඉම් ලකුණු කවරේද;

(v) එම ලකුණු ලබාගත් නිලධාරීන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(vi) පරීක්ෂණය සමත් වූ නිලධාරීන්ට පත්වීම් ලබාදුන් දිනය එක් එක් නිලධාරියා අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?